# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1875/28 - 2014 අගෝස්තු මස 13 වැනි බදාදා - 2014.08.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2003.

**2002 අංක 25 දරන සාපරාධී කරුණුවලදී**
**අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත**

**2 වන වගන්තිය යටතේ නියමය**

2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ, 2 වන වගන්තියේ (3) වන උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, අධිකරණ අමාත්‍ය අබ්දුල් රවුෆ් හකීම් වන මම, මේ නියමය මඟින් ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ බෙලාරුස් ජනරජයේ ආණ්ඩුව අතර, දෙදහස් දහතුනේ අගෝස්තු මස විසි හය වන දින මින්ස්ක් හි දී ඇති කර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් අදාළ වන බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටක් නොවන බෙලාරුස් ආණ්ඩුව අතර ඇති කර ගනු ලැබූ මෙම ගිවිසුම සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම සම්බන්ධයෙන් අදාළ වන අතර එය වෙනත් කරුණු අතර, ඔවුන්ගේ අදාළ අධිකරණ බල සීමා තුළ ත්‍රස්තවාදය හා සම්බන්ධ අපරාධ ඇතුළුව අපරාධ වැළැක්වීම, විමර්ශනය, නඩු පැවරීම සහ මැඩපැවැත්වීම සම්බන්ධයෙන් ගිවිසුමට අදාළ පාර්ශවයන් දෙක විසින් නීතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ඵලදායී බව සහයෝගිතාව තුළින් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ද අදාළ වේ.

අබ්දුල් රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2014 අගෝස්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

08 - 967

1A - PG 2137 — 350 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*